# පාසල කේන්ද්‍ර කර ගත් පර්යේෂණ සංස්කෘතියක් සඳහා...

## 2014-2015 වාර්තාව

**පර්යේෂණ හා සංවර්ධන ආයතනය**

2015

# පාසල කේන්ද්‍ර කර ගත් පර්යේෂණ සංස්කෘතියක් සඳහා...

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය පදනම් වී තිබෙනුයේ ශිෂ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම අරමුණු කර ගෙන ය. ජාතික පොදු අරමුණු පදනම් කර ගෙන, ශිෂ්‍ය නිපුණතා සංවර්ධනය විය යුතු ක්ෂේත්‍ර ලෙස ජාතික අධ්‍යාපන කොමිසම විසින් හඳුනා ගනු ලැබ ඇත්තේ සන්නිවේදනය හා තාක්ෂණවෙදය යි. මේ සෑම ක්ෂේත්‍රයක ම පර්යේෂණ නිපුණතා සංවර්ධනය වීම, යහපත් පුරවැසියකු වීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ ය.

නිපුණතා සපිරි ශිෂ්‍යයන්ගේ පර්යේෂණවලට අදාළ මූලික චරිත ලක්ෂණ වනුයේ දත්ත පාදක ව තීරණ ගැනීමට හුරු වීමත් තමා මුහුණ දෙන සමාජ අවස්ථාවල දී පර්යේෂණ ක්‍රම පදනම් කර ගෙන එම අවස්ථා විග්‍රහ කර තීරණ ගැනීමත් නිරන්තර ව තම සමාජ හා භෞතික පරිසරය විද්‍යාත්මක ව තේරුම් ගැනීමට යොමු වී එය සංරක්ෂණය කිරීමේ යහ ආකල්ප ඇති කර ගැනීමත් ය.

රටක සංවර්ධනය සඳහා ද පර්යේෂණ පදනම් කර ගෙන තීරණ ගැනීම අවශ්‍ය වේ. එහෙයින් පාසල් අධ්‍යාපනයේ අරමුණක් විය යුත්තේ ද නිවැරදි තීරණ ගැනීමට හැකි ලෙස පාසලේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් හුරුපුරුදු කිරීම ය.

මේ පදනම මත අනාගත පුරවැසියා බිහි කරන්නට ඇති සමාජ යාන්ත්‍රණය වන පාසල, පර්යේෂණ නිපුණතා සංවර්ධනය කරන්නට ද යොමු වූ සංස්ථාවක් විය යුතු ය. ඒ සඳහා වන පහසු මගක් වන්නේ දැනට පාසලේ ක්‍රියාත්මක වන විෂය මාලාවේ විවිධ විෂය හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පාදක ව ම පර්යේෂණ දැනුම, කුසලතා හා ආකල්ප පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දීම ය. මේ සඳහා පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන 'පාසල කේන්ද්‍ර කර ගත් පර්යේෂණ සංස්කෘතියක්' සඳහා වැඩසටහනේ දී සිදු වනුයේ පාසලේ දී උගන්වන විෂය කරුණුවලින් සෘජු ව හා ආධ්‍යාහාරයෙන් මතු කර ගත හැකි පර්යේෂණ සංකල්ප සිසුන්ටත් ගුරුවරුන්ටත් ලබා දීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම ය.

2014 වර්ෂයේ මැයි මස අරඹන ලද "පාසල කේන්ද්‍ර කර ගත් පර්යේෂණ සංස්කෘතියක් සඳහා" වැඩසටහනට මේ වන විට වසරක් සපිරේ. මෙම වසරේ දී කළ මෙහෙවර ගැන මදක් ආපසු හැරී බැලීමට කාලය මෙයයි. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2008 /2009 වර්ෂයේ ළමයින්ගේ ක්‍රියාකාරිත්ව වාර්තාවට අනුව අවුරුදු 5-17ත් අතර වයසේ ළමයි 4,338,709ක (උතුරු පළාත හැර) ප්‍රමාණයක් සිටිති. එයින් 2,198,482 (50.7%) දෙනෙක් පිරිමි ළමයින් වන අතර, 2,140,227 (49.3%) දෙනෙක් ගැහැනු ළමයි වෙති. මෙම සම්පූර්ණ ජනගහනයෙන් 586,680 (13.5%)

දෙනෙක් නාගරික ප්‍රදේශවල ද 257,870 (5.9%) දෙනෙක් වතුකරයේ ද වැඩි ම ප්‍රමාණය වූ 3,494,159 (80.5%) දෙනෙක් ග්‍රාමීය ප්‍රදේශවල ද ජීවත් වෙති. මෙම ළමයින් වයස් කාණ්ඩ අනුව ගත් කල අවුරුදු 5-11ත් අතර 2,292,887ක් ද (52.8%) වයස අවුරුදු 12-14ත් අතර 1,007,835ක් ද (23.2%) වයස අවුරුදු 15-17 අතර 1,037,990ක් ද (23.9%) ලෙස සිටිති.

ශ්‍රී ලංකාවේ තිබෙන මුළු පාසල් සංඛ්‍යාව 10,852ක් වන අතර එහි සේවය කරන මුළු ගුරුවරුන් සංඛ්‍යාව 239,766කි. මෙය ගුරු ශිෂ්‍ය අනුපාතයක් ලෙස බැලූ විට 1:18කි. මෙම වසරේ දී ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ මූලික කොටගෙන සිසුන් 4000කට සහ ගුරුවරුන් 600කට ආසන්න ප්‍රමාණයකට පර්යේෂණවල මූලික සංකල්ප පිළිබඳ දැනුවත් කරන්නට අපගේ ඉහත වැඩසටහන් මාලාව මගින් හැකි ව තිබේ. මේ සඳහා වැඩමුළු මෙන් ම දේශන උපයෝගි කොට ගැනිණි.

ශ්‍රී ලංකාවේ 4000ක් පමණ වන පර්යේෂකයන් ප්‍රමාණය 2020 වර්ෂයේ දී 20,000 දක්වා ඉහළ නැංවීම තම අපේක්ෂාව බව රජයේ 2013 වර්ෂයේ අයවැය වාර්තාවේ දක්වා තිබූ අතර, මෙම වැඩසටහන නිහඬ වූ පරිසරයක සක්‍රිය ලෙස ඊට දායක වෙමින් තිබෙන බව සඳහන් කළ යුතු ය. විශේෂයෙන් ම පාසලේ සිටින්නා වූ පර්යේෂණයට දක්ෂ දරුවන් හට අත්වැලක් සැපයීම මෙහි ප්‍රධාන අරමුණ වන අතර ම ගුරුවරුන්, දෙමව්පියන් හා ළමයින් අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාව අවබෝධයෙන් යුතු සබඳතාවක් බවට පත් කිරීම තවත් අරමුණක් වේ. මෙම වැඩසටහන ආරම්භයේ පටන් ම ගුරුවරුන් හා සිසුන් තුළ මහත් වූ උත්තේජනයක් ඇති කළ වැඩසටහනක් බවට ඔවුන්ගෙන් ලැබුණු ප්‍රතිචාර අනුව පැවසිය හැකි ය. පාසලේ ක්‍රියාත්මක වන උසස් පෙළ ව්‍යාපෘතිවල ඇති වටිනාකම හඳුනා ගත් අප පර්යේෂණ කණ්ඩායම, එම ව්‍යාපෘති ක්‍රමානුකූල ව හා ක්‍රමවත් ව කළ යුතු අන්දම පිළිබඳ සිසුන් ව දැනුවත් කරන ලදී.

මෙම වැඩසටහන සඳහා අප කණ්ඩායමට නිරතුරු ව විද්වතුන්ගේ සහාය, උපදේශනය සහ සහභාගිත්වය ලැබිණි. තව ද ප්‍රදේශීය වශයෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලින් ලැබුණු සහයෝගය ඉතා සතුටින් මතක් කළ යුතු වේ.

# <u>වැඩසටහනේ අරමුණු</u>

- පාසල් විෂය මාලාවෙහි පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පර්යේෂණ සංකල්ප ලබා දිය හැකි විෂය කොටස් ඒ ඒ විෂයයෙන් හඳුනා ගැනීම

- හඳුනා ගත් විෂය කොටස් සඳහා ද ඒවා හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ද උචිත පර්යේෂණ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම

- පර්යේෂණ ක්‍රියාකාරකම් පාසල් තලයේ ක්‍රියාත්මක කිරීමෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පර්යේෂණ නිපුණතා සංවර්ධනය වන අයුරු නියාමනය කිරීම

- ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පර්යේෂණ නිපුණතා සංවර්ධනයට ගුරුවරුන් සහ දෙමාපියන්ට මැදිහත් විය හැකි ආකාරය හඳුන්වා දීම

# <u>වර්තමාන ප්‍රගතිය</u>

## <u>පාසල කේන්ද්‍ර කර ගත් පර්යේෂණ සංස්කෘතියක් සඳහා වැඩසටහන</u>

මෙහි පළමු වැඩසටහන බත්තරමුල්ල ඉන්ද්‍රජෝති විද්‍යාලයේ දී පැවැත්විණි. මේ සඳහා පාසලේ 6 වසරේ සිට 11 වසර දක්වා සිසු සිසුවියෝ 148 දෙනෙක් ද ආචාර්ය මණ්ඩලයේ 21 දෙනෙක් ද සහභාගි වූහ.



දෙ වන වැඩසටහන මහනුවර මද්දුම බණ්ඩාර විද්‍යාලයේ දී පවත්වන ලද අතර, ඊට පාසලේ 1-11 ශ්‍රේණිවල සිසු සිසුවියෝ 43 දෙනෙක් හා ආචාර්ය මණ්ඩලයේ 10 දෙනෙක් ද සහභාගි වූහ.



තුන් වන වැඩසටහන හෝකන්දර විද්‍යාලෝක විද්‍යාලයේ දී පවත්වනු ලැබිණි. මෙයට සිසු සිසුවියෝ 135 දෙනෙක් සහභාගි වූහ. මෙම පාසලේ දී ගුරුවරුන් සඳහා "ක්‍රියාමූලික පර්යේෂණ" හඳුන්වා දීමේ වැඩසටහනක් ද මෙයට සමගාමී ව පැවැත්වූ අතර, පාසලේ අචාර්ය මණ්ඩලයේ සියලු දෙනා ඊට සහභාගි වූහ.





## <u>උසස් පෙළ සිසු සිසුවියන්ට පාසල් ව්‍යාපෘති සඳහා මග පෙන්වීම</u>

අ.පො.ස (උ.පෙ.) සිසුන් කරනු ලබන පාසල් ව්‍යාපෘති සරල ව කරන අයුරු සම්මන්ත්‍රණ හා වැඩමුළු මගින් පැහැදිලි කර දෙන ලදී. මෙය ද ඔවුන්ගේ අනාගත පර්යේෂණ නිපුණතා සංවර්ධනයට මහත් සේ ඉවහල් වනු නො අනුමාන ය. මෙහි පළමු වැඩසටහන නිකවැරටිය මහසෙන් ජාතික පාසලේ දී පැවැත්වූ අතර එයට කලාපයේ සිසුන් 1000කට ආසන්න ප්‍රමාණයක් ද ව්‍යාපෘති භාර ආචාර්යවරුන් 50කට ආසන්න ප්‍රමාණයක් ද සහභාගි වූහ.








# පාසල්වලට ළමා මනස හා සම්බන්ධ ව ක්‍රියාමූලික පර්යේෂණ කළ හැකි අයුරු හඳුන්වා දීම

**(පාසල් සිසු සිසුවියන්ගේ ඉගෙනුම සහ මනස පිළිබඳ ක්‍රියාමූලික පර්යේෂණ පාඨමාලාව)**

පාසල් ගුරුවරුන් මූලික කර ගෙන පැවැත්වෙන මෙම වැඩසටහනේ පළමුවැන්න පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දී පැවැත්වුණු අතර ඒ සඳහා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ උනන්දුව දක්වන වෘත්තිකයෝ 15 දෙනෙක් සහභාගි වූහ.












දෙ වන වැඩසටහන වයඹ පළාතේ නිකවැරටිය අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සඳහා පැවැත්වූ අතර, ඒ සඳහා ගුරුවරු 15 දෙනෙක් සහභාගි වූහ.






මෙම වැඩසටහන අදියර තුනකින් යුක්ත වන අතර, ඉහත කණ්ඩායම් දෙක සඳහා එහි දෙවන අදියර මේ වසරේ දී පැවැත්වීමට නියමිත ය.

මෙයට අමතර ව ක්‍රියාමුලික පර්යේෂණ හඳුන්වා දීම සඳහා වූ 3 වන වැඩමුළුව අධ්‍යාපන අමාත්‍යාංශයේ පළාත් පර්යේෂණ සම්බන්ධිකරණ නිලධාරින් සඳහා පැවැත්විණි. අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධ ව මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී. සෑම පළාතක් ම නියෝජනය පරිදි 25 දෙනකුගේ පර්යේෂණවල නියැළි කණ්ඩායමක් ඊට සහභාගි වූහ.








තව ද ක්‍රියාමූලික පර්යේෂණ හඳුන්වා දීම සඳහා, දිවයිනේ විවිධ ප්‍රදේශවල සම්මන්ත්‍රණ පවත්වනු ලැබිණි. මේ සඳහා ද ප්‍රදේශිය වශයෙන් ගුරුවෘත්තියේ මෙන් ම අධ්‍යාපන පරිපාලකයෝ ද බොහෝ පිරිසක් සහභාගි වූහ.







## සාරාංශය

මෙලෙස වසරක කාලයක් ඇතුළත අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහෝ පිරිසක් පර්යේෂණ ක්ෂේත්‍රයට නැඹුරු කිරීමට අපට මෙම වැඩසටහන් මාලාව ඔස්සේ හැකියාව ලැබිණි. එමෙන් ම පාසල් සිසු / සිසුවියන්ට පර්යේෂණ සංකල්ප ළමා කාලයේ දී ම තහවුරු කිරීමට හා අ.පො.ස (උ.පෙ.) හදාරන සිසුන්ගේ පාසල් ව්‍යාපෘතිය කිරීමට අවශ්‍ය මග පෙන්වීමට හැකි වීම ද අප ලැබූ මහත් ජයග්‍රහණයක් බව ගෙන හැර දැක්විය හැකි ය. මෙම වැඩසටහනේ තිබෙන්නා වූ අඩුපාඩු සකස් කොට ඉතා සක්‍රිය ලෙස මුළු දිවයින පුරා ව්‍යාප්ත කිරීම අපගේ ඒකායන අධිෂ්ඨානය වේ.

## විශේෂ ස්තූතිය

මෙම වැඩසටහන් සඳහා සහභාගි වූ සියලු ම දෙනාට ද සංවිධාන කටයුතුවල දී නන් අයුරින් උපකාර කළ සියලු දෙනාට ද වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා නිබඳ ව උපදේශන ලබා දුන් ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන් සැමට ද තම වටිනා කාලය, ශ්‍රමය හා කැපවීම තුළින් මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට සම්පත් දායකත්වය දැක්වූ සෑම දේශකයකුට ම ද අපගේ විශේෂ ස්තූතිය හිමි විය යුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

**01.**Child Activity Survey 2008 / 2009
Department of Census and Statistics, Ministry of Finance and Planning - Sri Lanka

**02**. Gaveshana Magazine - Institute for Research and Development
All 23 issues

**03**. වව්නියාව හා මුලතිවු අධ්‍යාපන කලාපයේ, නිදහස් අධ්‍යාපන සේවා පිළිබඳ පුරවැසි වාර්තාපත් සමීක්ෂණ -2014 නොවැම්බර් ISBN - 978-955-1040-86-4

**04.** Statistical Pocket Book 2013 / 2014
Department of Census and Statistics, Ministry of Finance and Planning - Sri Lanka

**05**. සංඛ්‍යා අත්පොත - 2014
Department of Census and Statistics, Ministry of Finance and Planning - Sri Lanka